# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1986/47 - 2016 සැප්තැම්බර් මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2016.09.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට තිස්සමහාරාම ජල සම්පාදන ක්‍රමය වැඩි දියුණු කිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 05 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1209.

#### උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 37, දෙබරවැව ග්‍රාම නිලධාරී වසමේ දෙබරවැව ගමේ පිහිටි කිරිදිඹය රක්ෂිතය නමැති ඉඩම පෙන්නුම් කෙරෙන බලයලත් මිනින්දෝරු ටී. එච්. ජීවානන්ද මහතා විසින් පිළියෙල කරන ලද අංක 2009/WB/25 දරන පිඹුරේ කැබලි අංක 1 දරන ඉඩමට උතුරු දෙසින් පිහිටා ඇති සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 12.5 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | ටී. එච්. පුන්‍යරතන මහතා හිමිකම් කියන ඉඩම ; |
| *නැගෙනහිරට* | : | ගැමුණුපුර සිට තිස්සමහාරාමය දක්වා වූ මාර්ගය ; |
| *දකුණට* | : | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ඉඩම ; |
| *බටහිරට* | : | කිරිදිඹය. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : ප්‍රාදේශීය සභාව,
තිස්සමහාරාමය.

10 - 360

1A - G 24292 — 17 (2016/09)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට යාපනය කිලිනොච්චිය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය යටතේ යාපනය නගර මලාපවහන පොම්පාගාර අංක 21 ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍යවී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 සැප්තැම්බර් මස 26 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/3/1204.

*උපලේඛනය*

යාපනය දිස්ත්‍රික්කයේ, යාපනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක J/83, කොඩ්ඩාඩි ග්‍රාම නිලධාරී වසමේ යාපනය නගර ගමේ පිහිටි කට්කුලම් පොකුණ නැමති ඉඩමෙන් 6m x 4m ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස ඃ

| | | |
|---|---|---|
| උතුරට | ඃ | කට්කුලම් පොකුණ ; |
| නැගෙනහිරට | ඃ | යූනියන් පාර ; |
| දකුණට | ඃ | එම්. සිවසාන්තිවේල් හිමිකම් කියන ඉඩම ; |
| බටහිරට | ඃ | කට්කුලම් පොකුණ. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* ඃ 01. මහ නගර සභාව,
යාපනය.

10 - 361

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.